# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2185/2 - 2020 ජූලි මස 20 වැනි සඳුදා - 2020.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: බිය3/1/1/510 ඉඅ.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

ගම්පහ දිස්ත්‍රික්කයේ, බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වල්ගම බටහිර ගමෙහි පිහිටි ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද මු. පි. ගම 4206 සහ 2020.05.29 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 හා 02න් පෙන්නුම් කෙරෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 1.6479 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි දෙක (02) :

1. **කැබලි අංක 01**

ඉඩමේ නම : අළුවින්නේ කුඹුර හා කිදෙයිඉස්මත්ත; වර්තමාන ඉඩම් පරිහරණය : වගුරු බිම ; හිමිකම් කියන්නා : සොයාගත නොහැක ; ප්‍රමාණය : හෙක්ටයාර් 1.6178 (අ. 3 රූඩ් 3 පර්. 39.6)

2. **කැබලි අංක 02**

ඉඩමේ නම : අළුවින්නේ කුඹුර හා කිදෙයිඉස්මත්ත; වර්තමාන ඉඩම් පරිහරණය : මාර්ගය ; හිමිකම් කියන්නා : සොයාගත නොහැක ; ප්‍රමාණය : හෙක්ටයාර් 0.0301 (අ. 0 රූඩ් 0 පර්. 11.9)

ඉහත සඳහන් ඉඩමට පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් පහත සඳහන් දිනයන්හිදී පහත සඳහන් වේලාවට බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

| *දිනය* | *කැබලි අංකය* | *වේලාව* |
|---|---|---|
| 2020.08.12 | 01 සහ 02 | පෙ. ව. 9.30 |

තව ද, 2020 අගෝස්තු මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එස්. ඒ. චන්දිමා සූරියආරච්චි,
ප්‍රාදේශීය ලේකම්,
බියගම.

2020 ජූලි මස 16 වැනි දින,
සපුගස්කන්ද, මාකොළ,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-14

1A - G 32522 – 17 (2020/07)   ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*